දිරාපත් වී යන ඇඳුමක් දිරාපත් වී යනවාක් මෙන් ඊමාන් හෙවත් විශ්වාසය ඔබ අතරින් කෙනෙකුගේ හදවත තුළ දිරාපත් වී යු ඇත. එබැවින් ඔබේ හදවත් තුළ දේව විශ්වාසය අලුත් කරන මෙන් අල්ලාහ්ගෙන් ඉල්ලා සිටින්න

අල්ලාහ්ගේ දූතයාණන් (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) ප්රකාශ කළ බවට අබ්දුල්ලාහ් ඉබ්නු අම්ර් ඉබ්නු අල්-ආස් (රළියල්ලාහු අන්හුමා) තුමා විසින් මෙසේ වාර්තා කරන ලදී.
"දිරාපත් වී යන ඇඳුමක් දිරාපත් වී යනවාක් මෙන් ඊමාන් හෙවත් විශ්වාසය ඔබ අතරින් කෙනෙකුගේ හදවත තුළ දිරාපත් වී යු ඇත. එබැවින් ඔබේ හදවත් තුළ දේව විශ්වාසය අලුත්
කරන මෙන් අල්ලාහ්ගෙන් ඉල්ලා සිටින්න." [صحيح] [رواه الحاكم والطبراني]

අලුත් ඇදුමක් දිගු කලක් භාවිත කිරීමෙන් දිරාපත් වී යන්නාක් මෙන් සැබැවින්ම ඊමාන් හෙවත් විශ්වාසය මුස්ලිම්වරයාගේ හදවත තුළ දිරා පත් වී යනු ඇතැයි නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණෝ අපට දන්වා සිටියහ. මෙයට හේතුව නැමදුම්හි දක්වන උදාසීනත්වය හෝ පාපකම් සිදු කිරීම සහ තෘෂ්ණාවෙහි ගිලී යාමය. අනිවාර්ය නැමදුම් ඉටු කිරීම, අධික ලෙස අල්ලාහ් ව මෙනෙහි කිරීම හා පාපක්ෂමාවෙහි නිරත වීම යනාදිය තුළින් අපගේ විශ්වාසය අලුත් කර දෙන මෙන් අප අල්ලාහ්ගෙන් ප්රාර්ථනා කළ යුතු බව නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණෝ අපට මඟ පෙන්වූහ.

http://sunnah.global/hadeeth/si/show/65020